# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

07 ශ්‍රේණිය | නැටුම් (දේශීය) | කාලය පැය 02

නම : ............................................................ පාසල :.......................................................

<u>සැලකිය යුතුයි</u>

❖ I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

## I කොටස

- නිවැරදි පිළිතුර වරහන තුලින් තෝරා හිස්තැන් පුරවන්න.

(නවම්, කප් සිටුවීම, ඇසළ, ගොප්කොළ, දණ්ඩි සරඹ, පුද්ගල අවකාශය, පොල්කොළ, ගොඩ සරඹ)

1) අධුනික ශිල්පියෙක් පළමුවෙන්ම නර්තන ඉගෙනීම ආරම්භ කළ යුත්තේ .................................................. වලින්ය.

2) නර්තනයේ යෙදෙන එක් පුද්ගලයෙකු මුළු ශරීරය විහිදුවා ලබා ගන්නා ඉඩ ප්‍රමාණය ................................................ නමින් හඳුන්වනු ලැබේ.

3) සැරසිලි අංගයක් නිර්මාණය කිරීමට පරිසරයෙන් සොයා ගත හැකි අමුද්‍රව්‍යයක් ලෙස ................................................ හැඳින්විය හැකිය.

4) සමන් දේවාල පෙරහැරෙහි සිදු කරන පළමු චාරිත්‍රය ලෙස ..................................................... හැඳින්විය හැකිය.

5) දළදා පෙරහැර ......................................................... නමින් ද හඳුන්වයි.

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

6) මෙහි ඇති රූපයෙන් දැක්වෙන්නේ,



i) නත්තල් ගසකි.

ii) තල මලකි.

iii) ඇහැළ මලකි.

iv) නිර්මාණාත්මක මලකි.

7) විනෝදය හා සතුට ප්‍රකාශ කිරීම සඳහා වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩයකි.

i) තම්මැට්ටම     ii) රබාන

iii) බෙරය     iv) දවුල

8) උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන් හි පාද හුරු කර ගැනීමේ මූලික අභ්‍යාස මේ නමින් හඳුන්වයි.

i) අත් සරඹ හා පා සරඹ   ii) ගොඩ සරඹ හා දොඹින පද

iii) පා සරඹ හා මණ්ඩි පද   iv) පා සරඹ හා දොඹින පද

9) කුළු නැටුම් සඳහා උචිත කවි නිර්මාණය වී ඇත්තේ,

i) පැදුරු මාලේ කවි වලිනි.   ii) රත්නවල්ලි කවි වලිනි.

iii) ඔංචිලි වාරම් වලිනි.   iv) කළගෙඩි මාලේ කවි වලිනි.

10) දොං ජිංත ගත දොංත / ගුං දෙගත ගත්ත ගුං යන මෙම බෙර පදය වාදනය කරන තිත් රූපය වන්නේ,

i) 4+4 ය.   ii) 2+4 ය.

iii) 3+4 ය.   iv) 2+3 ය.

- X පේළියට ගැළපෙන වචන Y පේළියෙන් තෝරා යා කරන්න.

| X | Y |
|---|---|
| 11) තෙල්මෙ ඇඳුම් කට්ටලය | ඔළිඳ කෙළිය |
| 12) තාල තැබීමට යොදා ගනී | දවුල |
| 13) ජන ක්‍රීඩාවකි | රබන් පදයකි |
| 14) සබරගමු නැටුම් | පහතරට |
| 15) උඩහ ගෙදර තුන් දෙනයි | තාලම්පට |

- පහත සඳහන් ප්‍රකාශ හරි නම් (√ ) ලකුණද වැරදි නම් (X ) ලකුණද වරහන් තුල යොදන්න.

16) පබළු ඇඳුම් කට්ටලය සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටලය වේ. (   )

17) ගැමි නැටුම් වලදී ගායනය ප්‍රබල පිටුවහලක් නොවේ. (   )

18) නර්තන ක්‍රියාවලියේදී අවකාශ භාවිතය ඉතා වැදගත් වේ. (   )

19) දෙතිතේ තාල රූප 3 කි. (   )

20) තාලම් නැටුම් සාම්ප්‍රදායික නර්තන අංගයකි. (   )

## II කොටස

- ❖ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- ❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

(01) දේශීය නර්තන සම්ප්‍රදායන් තුනකි. ඒ ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii) එම සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය සහ රංග වස්ත්‍රාභරණ කට්ටලය නම් කරන්න. (ලකුණු 02)

iii) සම්ප්‍රදායන් තුනටම අයත් ශාන්තිකර්ම ලියන්න. (ලකුණු 03)

iv) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායේ මාත්‍රා 2+2 තාල රූපයට අයත් බෙර පදයක් ලියන්න.

(ලකුණු 02)

(02) ඇසල උත්සවයේ පවත්වන ප්‍රධාන ආගමික හා සංස්කෘතික අංගයක් ලෙස පෙරහැර හැඳින්විය හැකිය.

i) ඒ ඒ ප්‍රදේශයන්ට ආවේණික වූ පෙරහැරවල් නම් කරන්න. (ලකුණු 03)

ii) එම පෙරහැරවල් වල දක්නට ලැබෙන නර්තනාංග හා වාදන අවස්ථා සඳහා භාවිතා කරන වාද්‍ය භාණ්ඩ නම් කරන්න. (ලකුණු 03)

iii) පෙරහැරක දක්නට ලැබෙන සැරසිලි වර්ග නම් කරන්න. (ලකුණු 04)

(03)

i) දෙතිතේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 03)

ii) තුරඟා වන්නමට අයත් කවියක් හෝ හවාදි තාලයට අයත් කවියක් ලියන්න. (ලකුණු 03)

iii) දෙතිතේ ප්‍රභේදයකට අයත් රබන් පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(04)

i) ඔබ දන්නා ගැමි නැටුම් 3ක් නම් කරන්න. (ලකුණු 03)

ii) ඒවාට අයත් රංග භාණ්ඩ 2ක් සහ රංග රටා දෙකක් ඇඳ දක්වන්න. (ලකුණු 04)

iii) ඔබ දන්නා තාලම් කවියක් ලියන්න. (ලකුණු 03)